(ආ) රුපියල් විසි හතර මිලියන පන් ලක්ෂ තිස් පන් දහස් නවසිය අනූ හතරයි ශත දහයක (රු. 2,45,35,994.10) මුදල සමග විකිණීමේ දිනය දක්වා ඉහත කී මුදල් මත ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා පොලිය සහ 1990 අංක.4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි ගාස්තු සහ මුදල්, පසුව ලද මුදල්(වෙතොත්) අඩු කරමින්, අයකර ගැනීම සඳහා කොළොන්නාව, විහාර මාවත අංක.182/3 (50/3) හි බලපත්‍රලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත එකී අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

*1. උකස්කර අංක 9164 සහ 9586 යටතේ උකස් කළ දේපළ*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙ පත්තුවේ, සල්පිටි කෝරළේ, දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව ඇතුළත, වටරප්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගල්කිස්ස, හුළුදගොඩ පාර වරිපනම් අංක. 63 (දනට වරිපනම් අංක 65 දරන) තලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. වී. හොප්මන් මයා විසින් සකසන ලද අංක.40/1989 දරන 1989/10/25 වන දිනැති පිඹුරෙහි ලොට් 2 වශයෙන් දක්වා ඇති උතුරට : හුළුදගොඩ පාර ද, නැගෙනහිරට : පාර ද (අඩි 12-18 පළල්වූ), දකුණට : හුළුදගොඩ පාර වරිපනම් අංක 65/1 සහ 65/1 ඒ දරන පරිශ්‍රයන් ද, බස්නාහිරට : මෙහි ලොට් 1 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසිතුනයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 23.50) වූ බෙද වෙන් කරන ලද ඉඩම සහ එහි පස, ගහකොළ, වැව්ලි සහ එයමත වූ සියල්ලද සමග වේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 1687/37 හි ලියාපදිංචිව ඇත.

*2. උකස්කර අංක 8993 යටතේ උකස් කළ දේපළ*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, ගෝනාපිනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තිලකගම ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 66E ඇතුළත බෙරතුඩුවෙහි පිහිටා ඇති බලයලත් මානක ඩබ්. ජී ඩී. යූ. කරුණාරත්න මයා විසින් සකසන ලද 2001 පෙබරවාරි මස 01 දිනැති අංක 58/2001 දරන පිඹුරෙහි දක්වෙන බොරකඩිත්තහේන සහ බොරකඩිත්තබැද්ද සහ කීණගහබැද්ද නමැති ඉඩමෙන් බෙද වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් දෙකක් වන ලොට් 01 සහ 02 නමැති උතුරට : ටී. පී. 174528 හි ලොට් 1, ජී.ආරියරත්න සහ අනෙකුත් අයගේ සහ ප්‍රේමා උඩුගම්පොල සහ අනෙකුත් අය සතු කුඹුරු ද, නැගෙනහිරට : ප්‍රේමා උඩුගම්පොලට අයත් කුඹුරු සහ ගම්වැසියන් හිමිකම් පාන අනික් ඉඩම ද, දෙන් ඩොනල්ඩ් වික්‍රමරත්නගේ උරුමක්කරුවන් හිමිකම් පාන ඉඩම සහ ඩී. සයිමන් ද සිල්වා වික්‍රමසිංහ සහ පණ්ඩු කන්නන්ගරගේ උරුමක්කරුවන් හිමිකම් පාන බොරකඩිත්ත කුඹුරු ද, දකුණට : හික්කඩුව සිට අළුත්ගම දක්වා මහ පාර, පිඹුරු අංක.854 හි ලොට් 02 සහ එම ඉඩමේ ලොට් 3 වශයෙන් ලකුණු කළ අඩි 8 පළල පාර ද සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 3 වශයෙන් ලකුණු කළ පාර, රජයේ ඉඩම, ජී.ක්‍රිෂාන්ත ද සිල්වා හිමිකම් පාන ඉඩම සහ ටී.පී.1745028 හි ලොට් 1 ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නවයයි රූඩ් දෙකයි පර්චස් විසිහය (අ. 09, රූ. 02, පර්. 26) ක්වූ ඉඩම සමග එහි පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මතවූ සියල්ලද සමග වූ ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සී.746/234 හි ලියාපදිංචි කළ ඉඩම වේ.

මෙහි පහත විස්තර කර ඇති පාර මතින් හා එය ඔස්සේ පාර භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ.

ඉහත කියන ලද බෙරතුඩුව හි පිහිටා ඇති බොරකඩිත්තහේන සහ බොරකඩිත්තබැද්ද සහ කීණගහබැද්ද නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඩබ්. සිල්වා විසින් සකසන ලද අංක.854 සහ 1997 අප්‍රේල් 18 දිනැති පිඹුරෙහි ලොට් 03 වශයෙන් ලකුණු කර ඇති (අඩි 8ක් පළල පාර සඳහා වෙන්කිරීම) උතුරට : එම ඉඩමෙහි ලොට් 1 ද, නැගෙනහිරට : එම ඉඩමෙහි ලොට් 1 ද, දකුණට : හික්කඩුව සිට අළුත්වල දක්වා වූ පාර ද, බස්නාහිරට : හික්කඩුව සිට අළුත්වල දක්වා වූ පාර ඔස්සේ රක්ෂිතය ද සහ එම ඉඩමෙහි ලොට් 2 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ 0, රූ. 0, පර්. 10 ) බෙද වෙන් කරන ලද ඉඩම වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C 698/241 හි ලියාපදිංචි කළ ඉඩම වේ.

*3. උකස්කර අංක 8993 යටතේ උකස් කළ දේපළ*

(i) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගඟබඩ පත්තුවේ වැලිවිටිය දිවිතුර ලේකම් කොට්ඨාසයේ, අම්පේගම අංක 192 ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුලත දිවිතුර හි පිහිටා ඇති බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මයා විසින් සකසන ලද 2001 මාර්තු මස 20 වන දිනැති අංක. 817 දරන පිඹුරෙහි දක්වෙන නාගස්කන්ද නමැති ඉඩමෙහි ලොට් 2 බෙද වෙන් කළ ලොට් 1 සිට 6 දක්වා වූ කැබලි ඒකාබද්ධ කරන ලද ලොට් AU දරන කැබැල්ල නමැති උතුරු නැගෙනහිරට : නාගස්කන්ද ද, දකුණු නැගෙනහිරට : නාගස්කන්ද සහ එම ඉඩමෙහි ලොට් 'AZ', ද දකුණු බස්නාහිරට : (වඩාත් නිවැරදිව බස්නාහිරට) එම ඉඩමෙහිම ලොට් 'AZ', 'AW', 'AX', 'AY', 'AVI' සහ 'TI' ද, දකුණු බස්නාහිරට : (වඩාත් නිවැරදිව බස්නාහිරට) එම ඉඩමෙහි ලොට් 'AB1', 'AB2', 'T2', සහ 'AQ' (අඩි 20ක් පළල පාර) ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි සහ පර්චස් තිස්තුනක් (අ. 01, රූ. 02, පර්. 33) ක්වූ ඉඩම, පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මත වූ අනිකුත් සියල්ලද සමග වේ.මෙම ඉඩම ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H 189/243 හි ලියාපදිංචි කළ ඉඩම වේ.

(ii) ඉහත කියන ලද දිවිතුර හි පිහිටා ඇති නාගස්කන්ද නමැති ඉඩමෙහි ලොට් 2 බෙද වෙන් කළ ලොට් 1 සිට 6 දක්වා කැබලි ඒකාබද්ධ කර නැවත බෙද වෙන් කළ ලොට් 'AZ', 'AZ1','AZ2', 'AW', 'AX' සහ 'AY' දරන කැබලි ඒකාබද්ධ කරන ලද ලොට් 1 නමැති, උතුරට : එම ඉඩමෙහිම ලොට් 'AV1' සහ 'AU' ද, නැගෙනහිරට : එම ඉඩමෙහිම ලොට් 'AU' සහ එම ඉඩමෙහිම කොටසකින් ද, දකුණට : එම ඉඩමෙහිම ලොට් 2 සහ 3 ද, බස්නාහිරට : එම ඉඩමෙහිම ලොට් 'AV1' සහ 2 ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් තුනක් (අ. 0, රූ. 02, පර්. 33 ) ක් වූ බලයලත් මානක ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මයා විසින් සකසන ලද අංක 1400/2001 දරන 2001 නොවැම්බර් මස 3 වැනි දින දරන පිඹුරෙහි දක්වා ඇති ගාල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H 236/61 හි ලියාපදිංචි කළ ඉඩම , පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මත වූ අනිකුත් සියල්ල ද සමග වේ.

(iii) ඉහත කියන ලද දිවිතුර හි පිහිටා ඇති නාගස්කන්ද නමැති ඉඩමෙහි ලොට් 2 බෙද වෙන් කළ ලොට් 1 සිට 6 දක්වා වූ කැබලි ඒකාබද්ධ කර නැවත බෙද වෙන් කළ ලොට් 'AV' බෙද වෙන් කළ ලොට් 'AV1' වශයෙන් ලකුණු කළ කැබැල්ල නමැති උතුරට :- එම ඉඩමෙහිම ලොට් 'T' සහ 'AU' ද, නැගෙනරහිරට : එම ඉඩමෙහිම ලොට් 'AU' සහ 'AV' ද, දකුණට : ලොට් 'AW' සහ එම ඉඩමෙහිම 'AV2' සහ එම ඉඩමෙහිම 'AS' වශයෙන් ලකුණු කළ පාර සහ බස්නාහිරට: එම ඉඩමෙහිම ලොට් 'T' සහ 'AV2' ද මායිම් වූ, ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් නවය (අ. 0, රූ. 02, පර්. 09) ක් වූ

බලයලත් මානක ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මයා විසින් සකසන ලද අංක.817 දරන 2001 මාර්තු 20 දින දරන පිඹුරෙහි දක්වා ඇති ගාල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එච්. 190/223 හි ලියාපදිංචි කළ ඉඩම , පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මත වූ අනිකුත් සියල්ලද සමග වේ.

(iv) ඉහත කියන ලද දිවිතුර හි පිහිටා ඇති නාගස්කන්ද නමැති ඉඩමෙහි ලොට් 2 හි ඒකාබද්ධ කළ ලොට් 1 සිට 6 හි ලොට් T හි බෙදා වෙන් කරන ලද ලොට් 'T2' දරන කැබැල්ල නැමැති උතුරට : එම ඉඩමෙහිම ලොට් 'AD' සහ 'AB1', නැගෙනහිරට : එම ඉඩමෙහිම ලොට් 'AU' ද, දකුණට : එම ඉඩමෙහිම ලොට් AV1 සහ T1 ද, බස්නාහිරටඃ එම ඉඩමෙහිම ලොට් 'AD' ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දෙකක් (අ. 0, රූ. 0, පර්. 02) ක් වූ බලයලත් මානක ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මයා විසින් සකසන ලද අංක.817 දරන 2001 මාර්තු මස 20 වැනි දින දරන පිඹුරෙහි දක්වා ඇති ගාල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එච්.188/223 හි ලියාපදිංචි කළ ඉඩම , පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මතවූ අනිකුත් සියල්ලද සමග වේ.

*4. උකස්කර අංක. 9059 යටතේ උකස් කළ දේපළ*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව ලේකම් කොට්ඨාශයේ, හික්කඩුව නගරය අංක 59 ඒ දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත හික්කඩුවෙහි පිහිටා ඇති බලයලත් මානක පී. එච්. ද සිල්වා මයා විසින් සකසන ලද අංක 611 සහ 1998 නොවැම්බර් 10 දිනැති පිඹුරෙහි වරිපනම් අංක 180 සහ 186 ගාලු පාර වශයෙන් දක්වා ඇති 'ඔරුතොටපෙලකැටියවත්ත' සහ 'මුදිල්ලගහවත්ත' හෙවත් 'බංගසාලවත්ත' නමැති ඉඩමෙහි ලොට් 01 වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කරන ලද එකී ලොට් 01 උතුරට : හික්කඩුව ප්‍රාදේශීය සභා පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : කොළඹ සිට ගාල්ල දක්වා වූ මහපාරද, දකුණට : වරිපනම් අංක.182 දරන ''මුදිල්ලගහවත්ත' හෙවත් 'බංගසාලවත්ත' ද, බස්නාහිරට : මුහුදු වෙරළ ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම තුනයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 15.31)ක් වූ ඉහත කියන ලද පිඹුරු අංක 611 හි දක්වා ඇති ගාල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සී. 717/170 හි ලියාපදිංචි කළ ඉඩම , පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මතවූ අනිකුත් සියල්ලද සමග වේ.

*5. උකස්කර අංක 9675 යටතේ උකස් කළ දේපළ*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව ඇතුලත පටබැඳිමුල්ල අංක.85 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් පටබැඳිමුල්ලෙහි පිහිටා ඇති අම්බලන්ගොඩ ප්‍රධාන වීදියේ වරිපනම් අංක 209 දරන දැනට වෝඩ් අංක 3 හි වරිපනම් අංක 209 සහ 227/6 දරන 'වැල්ලේවලවත්ත' නමැති ඉඩමෙහි ලොට් 02 දරන කැබැල්ල නමැති උතුරට : එම ඉඩමෙහිම ලොට් අංක. 01 න් ද, නැගෙනහිරට : මහ පාරද, දකුණට : එම ඉඩමෙහිම ලොට් අංක 03 න් ද, බස්නාහිරට : මුහුදු වෙරළ ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසිතුනයි දශම හතරයි එකක් (අ. 0, රූ. 0, පර්. 23.41) ක් වූ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ 150/245 හි ලියාපදිංචි කළ ඉඩම, පස , ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මතවූ අනිකුත් සියල්ලද සමග වේ.

මැතදී කරන ලද මැනීමකට අනුව ඉහත විස්තර කළ ඉඩම පහත සඳහන් පරිදි විස්තර කළ හැක.

අම්බලන්ගොඩ ප්‍රධාන වීදියේ වරිපනම් අංක.209 දරන දැනට වෝඩ් අංක.3 හි වරිපනම් අංක 209 සහ 227/6 දරන 'වැල්ලේවලවත්ත' නමැති ඉඩමෙහි ලොට් 02 වන උතුරට : එම ඉඩමෙහිම ලොට් අංක 01 (වරිපනම් අංක 211) න් ද, නැගෙනහිරට : ප්‍රධාන වීදියෙන් ද, දකුණට : වරිපනම් අංක 207 දරන එම ඉඩමෙහිම ලොට් අංක.03 න් ද, බස්නාහිරට : මුහුදු වෙරළ ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම හතරයි පහක් (අ.0, රූ. 0, පර්. 22.45) ක් වූ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ 150/245 හි ලියාපදිංචි කළ ඉඩම, පස , ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි, නිවස සහ ඒ මතවූ අනිකුත් සියල්ලද සමග වේ. මෙම ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ගාවින් ද සිල්වා විසින් මැන සාදන ලද 1985.10.29 වන දිනැති අංක 3015 දරන පිඹුරෙහි නිරූපණය වේ.

මෙම බලයලත් මානක ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මයා විසින් සකසන ලද අංක 97B/2014 සහ 2014 ජූනි 26 දිනැති පිඹුරෙහි පර්චස් විසි දෙකයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 22.25) ක් ලෙස දක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රජිත කරුණාතිලක,
සහකාර කළමණාකරු - අයකිරීම්.

06 - 177

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මාතර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුවන්ගේ නම : සංජය සේදර සෙනරත් සහ කලහෙ පණ්ඩිකෝරළලාගේ අරුණි මංජුලා කරුණාගොඩ.
ශාඛාව : මාතර.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.12.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, සංජය සේදර සෙනරත් සහ කලහෙ පණ්ඩිකෝරළලාගේ අරුණි මංජුලා කරුණාගොඩ විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්. 48

දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.12.08 දිනැති අංක 4881 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී අංක 4881 දරන උගස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2015.11.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් නව මිලියන දෙලක්ෂ පනස් දෙදහස් දෙසීය දහඅටයි ශත හැත්තෑ දෙක (රු. 92,52,218.72) ක මුදල සහ 2015.11.04 වැනි දින සිට රුපියල් නව මිලියන දෙලක්ෂ දහනව දහස (රු. 9,219,000) ක මුදල මත වාර්ෂිකව 2% බැගින් පොළියද, සහ 2015.11.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අසූ තුන් මිලියන හත් ලක්ෂ හැට දහස් හත් සීය අනූ නවයයි ශත විසි දෙක (රු. 8,37,60,799.22) ක මුදල සහ 2015.11.04 වැනි දින සිට රුපියල් හැත්තෑ අට මිලියන හය ලක්ෂ පනස් දහස් නවසිය දාහතයි ශත පනස් හත (රු. 7,86,50,917.57) ක මුදල මත වාර්ෂිකව 16% ක බැගින් පොළියද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 4881 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් අනූ තුන් මිලියන දහතුන් දහස් දාහතයි ශත අනූ හතර (රු. 9,30,13,017.94) ක මුදල ඉහතකී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළියද ශාස්තුද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3(50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

ඩී.ඩී.සී හීන්දෙනිය බලයලත් මානක විසින් සකස්කරන ලද 1998 පෙබරවාරි මස 15 දිනැති අංක 1185 දරන පිඹුරේ ලොට් අංක 1 වශයෙන් ලකුණු කරන ලද (සර්වෙයර් ජනරාල් විසින් සත්‍යවත් කරන ලද 1981.08.17 අංක.සීඕ 5630 දරන මූලික පිඹුරෙහි දක්වා ඇති ලොට් 1 සිට 6 දක්වා සහ ලොට් 7 හි කොටසක් සංසර්ජනය කිරීමක් වූ) බස්නාහිර පළාතේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ මරදාන වෝඩ් 25 පංචිකාවත්තෙහි පිහිටි ශ්‍රී සංඝරාජ මාවත, වරිපනම් අංක 14 සහ මරදාන පාර වරිපනම් අංක 79 හි පිහිටි පරිශ්‍රය වන එකී ලොට් 1 ට මායිම්, උතුරට : ශ්‍රී සංඝරාජ මාවත ද, නැගෙනහිරට : මරදාන පාරේ වරිපනම් අංක 9 දරන පරිශ්‍රය ද, දකුණට : මරදන පාර සහ බස්නාහිරට : මරදාන පාර ද වූ, එකී අංක 1185 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දෙළහයි දශම බිංදුවයි අට (අ. 0, රූ. 0, පර්. 12.08) ක් හෝ හෙක්ටයාර් 0.0306 ක්වූ ඉඩම සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ සියල්ලම ඇතුලුව ඒවායේ බදුකර අයිතිය වේ.

ඉහත විස්තර කර ඇති එකී ලොට් 1 පහත දැක්වෙන ඉඩමෙහි නැවත මිනුම් කිරීමකි.

සර්වෙයර් ජනරාල් විසින් සත්‍යවත් කරන ලද 1981.08.17 අංක සීඕ 5630 දරන මූලික පිඹුරෙහි දක්වා ඇති ලොට් 1සිට 7 දක්වා වශයෙන් ලකුණු කරන ලද්ද වූ බෙද වෙන් කරන ලද බස්නාහිර පළාතේ (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුලත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුල මරදන වෝඩ් 25 පංචිකාවත්තෙහි කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගේ කොට්ඨාසයෙහි පිහිටි මරදන පාරේ, වරිපනම් අංක 79, 81, 83, 87,89 සහ 93 සහ ශ්‍රී සංඝරාජ මාවත වරිපනම් අංක 14 දරණ එකී ඉඩමට මායිම් උතුරට : ශ්‍රී සංඝරාජ මාවත ද, නැගෙනහිරට : මරදන පාරේ වරිපනම් අංක 9, ගේන්ස්බරෝ වියුටරි - ඒ.ජේ. වේරගොඩ, ද, දකුණට : මරදන පාර සහ බස්නාහිරට : මරදන පාර ද වූ, අංක CO 5630 දරන පිඹුරට අනුව කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් අංක A 1097/37 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දෙළහයි දශම බිංදුවයි අට (අ. 0, රූ. 0, පර්.12.08) ක් හෝ හෙක්ටයාර් 0.0306 ක්වූ ඉඩම සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ සියල්ලම ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි

ඉරාන්ත් රොද්‍රිගු,
කළමණාකරු-අය කරගැනීම්.

06 - 178

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කිරුළපන ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

ජේ ඇන්ඩ් එච් ටෙක්නෝලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2016 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. එන්. එස්. සිල්වා විසින් 2013 පෙබරවාරි මස 20 වැනි දින සහතික කළ අංක 225, දරන බැඳුම්කරය මගින් ජේ ඇන්ඩ් එච් ටෙක්නෝලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා හර්ෂ අජිත් වල්පොළ උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් ජේ ඇන්ඩ් එච් ටෙක්නෝලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දුන් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇති හෙයින් ද,

එසේ හෙයින් ඉහත කී හර්ෂ අජිත් වල්පොළ යන අය එකී ජේ ඇන්ඩ් එච් ටෙක්නෝලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණය දරන බැවින් ඒ අනුව එකී හර්ෂ අජිත් වල්පොළ යන අය එකී ජේ ඇන්ඩ් එච් ටෙක්නෝලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යා අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් ජේ ඇන්ඩ් එච් ටෙක්නෝලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පහසුකමේ නියම අර්ථලාභියා වනුයේ එකී හර්ෂ අජිත් වල්පොළ යන අය වන හෙයින් ද,

එකී ජේ ඇන්ඩ් එච් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හර්ෂ අජිත් වල්පොළ යන අය හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද 2016 ජනවාරි මස 26 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත රුපියල් හැට එක් ලක්ෂ දහදහස් හාරසිය දෙකයි ශත පනස් තුන (රු. 61,10,402.53) ක මුදලක් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතුව හා ලැබිය යුතුය ඇති හෙයින් ද එකී (රු. 61,10,402.53) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016 ජනවාරි මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සමඟ ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 225 දරන උකස් බැඳුම්කරය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශිය සභා සීමාවේ කනන්විල උප කාර්යාලයේ තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 611 උතුරු බටුවිට ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ බටුවිට හි පිහිටි අඟුරුවලදෙණිය හෙවත් අඟුලුවලදෙණිය නැමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බලයලත් මිනින්දෝරු යූ. එල්. එන්. ටී. චන්දන විසින් 2008 දෙසැම්බර් මස 30 වැනි දින පිළියෙල කරන ලද අංක 4359 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ඉඩමට මායිම් වශයෙන් උතුරට : දෙපා ඇල ද, නැගෙනහිරට : දෙපා ඇල ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 6 ද අංක 3560 දරන පිඹුරේ ලොට් 1 බී සහ අංක 1039 දරන පිඹුරේ ලොට් බී ද සහ බස්නාහිරට : ගොඩපර ගහ පිල්ලෑව පාර සහ අංක 1039 දරන පිඹුරේ ලොට් බී සහ දෙපා ඇලෙන් ද මායිම් වූ එකී අංක 4359 දරන පිඹුර ප්‍රකාරව අක්කර තුනයි රූඩ් එකයි පර්චස් දොළහයි දශම පහයි බිංදුව (අ. 3, රූ. 1, පර්. 12.50 ) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම් කොටස මෙහි පහත සඳහන් ඉඩම් කොටස් ඒකාබද්ධව සැඳුම්ලත් වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ කනන්විල උප කාර්යාලයේ තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 611 උතුරු බටුවිට ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ බටුවිට හි පිහිටි අඟුරුවලදෙණිය හෙවත් අඟුලුවලදෙණිය නැමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් 2004 මැයි මස 10 වැනි දින පිළියෙල කරන ලද අංක 3561 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : දෙපා ඇල ද, නැගෙනහිරට : දෙපා ඇල ද, දකුණට : ලොට් 2 සහ 3 (අඩි 15ක් පළල වෙන් කරන ලද පාර) සහ අංක 1039 දරන පිඹුරේ ලොට් බී ද සහ බස්නාහිරට : දෙපා ඇල සහ අංක 1039 දරන පිඹුරේ ලොට් බී වලින් ද මායිම් වූ එකී අංක 3561 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහයයි දශම පහ (අ. 1, රූ. 3, පර්. 10.5)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය හොරණ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 239/239 ලියාපදිංචි වී ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ කනන්විල උප කාර්යාලයේ තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 611 උතුරු බටුවිට ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටුවිට හි පිහිටි අඟුරුවලදෙණිය හෙවත් අඟුලුවලදෙණිය නැමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් 2004 මැයි මස 10 වැනි දින පිළියෙල කරන ලද අංක 3561 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1 සහ දෙපා ඇල ද, නැගෙනහිරට : අංක 2059 දරන පිඹුරේ ලොට් 6 සහ දෙපා ඇල ද, දකුණට : අංක 3560 දරන පිඹුරේ ලොට් 1 බී සහ අංක 2059 දරන පිඹුරේ ලොට් 6 ද සහ බස්නාහිරට ලොට් 3 (අඩි 15ක් පළල වෙන්කරන ලද පාරද) සහ ගොඩපරගහපීල්ලෑවෙන් ද මායිම් වූ එකී අංක 3561 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් දෙක (අ. 1, රූ. 2, පර්. 0) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමග වන මෙය හොරණ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 239/240 ලියාපදිංචි වී ඇත.

එකී අංක 225 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇති මාර්ග අයිතීන්ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ.ඒ.එල්.ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

06 - 191/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කිරුළපන ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරනලද ණය ආපසු අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2016 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දි මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි

නමට ලියන ලද්දවූ ද 2015 ජුනි මස 18 වැනි දින සහතික කළ අංක 6163 දරණ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සරත් පරාක්‍රම ශ්‍රියාස් කොතලාවල, වික්‍රමආරච්චි මිල්ලවගේ චන්න කාලිංග කුමාරරත්න, වික්‍රමආරච්චි මිල්ලවගේ ප්‍රියන්ති කුමාරරත්න නොහොත් ප්‍රියන්ති සුරේන්ද්‍රානි කොතලාවල නමින් හඳුන්වන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්කෝටි පනස් නම ලක්ෂ අනූතුන් දහස් පන්සිය අනූතුනයි ශත අසූ හතර (රු. 3,59,93,593.84) ක මුදලක් 2016 මාර්තු මස 02 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී (රු. 3,59,93,593.84) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016 මාර්තු මස 03 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 6163 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරනලද ණය ආපසු අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ (නමුත් අත්තනගල්ල ලියාපදිංචි කොට්ඨාසයේ තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ මෙගොඩපොත උප කාර්යාලයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුණුපොළ අංක 352සී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෝපෙත්ත ගමේ හි පිහිටි පුංචි කුරුඳුවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසිංහ විසින් පිළියෙල කරන ලද 1976 මැයි මස 31 වැනි දින මැන සාදන ලද අංක පීපී සීම් 2802 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ඉඩමට මායිම් වශයෙන් උතුරට : එම්. ආර්. කේ. පියදසගේ මොරගහවත්ත පොල් ඉඩම ද, කේ. එච්. එල්. වී. ධනවතිගේ සහ තවත් අයගේ පුවක්දෙණිය කුඹුර සහ ගලිගහවත්ත පොල් ඉඩමෙන් ද, නැගෙනහිරට : නිට්ටඹුව සිට හංවැල්ල දක්වා දිවෙන පාරෙන් ද, දකුණට : ජයම්පති රාජකරුණාගේ කැකුනගහවත්ත ඉඩම ද, පාර, නිහාල් රාජකරුණාගේ කැකුණගහවත්ත ඉඩම ද සහ එච්. ඩබ්. රාජකරුණාගේ මීල්ලගහ කුඹුර ද සහ බස්නාහිරට : එච්. ඩබ්. රාජකරුණාගේ මීල්ලගහකුඹුර ද, ඩී. එස්. රාජකරුණාගේ මොරගහවත්ත ද, එම්. ආර්. කේ. පියදසගේ මොරගහවත්ත ද සහ ඩී. එස්. රාජකරුණාගේ කෝන්ගහලන් ද පොල් ඉඩමෙන් ද මායිම් වූ අක්කර තිස්තුනයි පර්චස් තිස්හය (අ.33, රූ.0, පර්. 36) ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම වන මෙය අත්තනගල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 94/124 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතක දී කළ මැනීමකින් පසු මෙසේ විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ (නමුත් අත්තනගල්ල ලියාපදිංචි කොට්ඨාසයේ තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ උඩුගහ පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ මෙගොඩපොත උප කාර්යාලය තුළ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හුණුපොළ අංක 352සී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෝපෙත්ත ගමේ හි පිහිටි පුංචි කුරුඳුවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. වෙතසාලාම් විසින් පිළියෙල කරන ලද 2004 ජුනි මස 17 වැනි දින පිළියෙල කරන ලද අංක 2342 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : එම්. ආර්. කේ. පියදස හිමිකම් කියන මොරගහවත්ත ද, ඩී. එස්. රාජකරුණා හිමිකම් කියන කෝන්ගහලන්ද ද, කේ. එච්. එල්. වී. ධනවතී සහ අනිකුත් අය හිමිකම් කියන පුවක්වත්තදෙණිය සහ ගලිගහවත්තෙන් ද, නැගෙනහිරට : නිට්ටඹුව සිට හංවැල්ල දක්වා දිවෙන ප්‍රධාන පාරෙන් ද, දකුණට : ජයම්පති රාජකරුණා හිමිකම් කියන කැකුනගහවත්තේ පාරද, (මීගල්ල සිට බෝපෙත්ත) නිහාල් රාජකරුණා හිමිකම් කියන කැකුනගහවත්තෙන් සහ එච්. ඩබ්. රාජකරුණා හිමිකම් කියන මීල්ලගහකුඹුරෙන් ද සහ බස්නාහිරට : එච්. ඩබ්. රාජකරුණා හිමිකම් කියන මීල්ලගහකුඹුරෙන් ද, ජී. එස්. රාජකරුණා හිමිකම් කියන මොරගහවත්තකුඹුරෙන්ද, එම්. ආර්. කේ. පියදස හිමිකම් කියන මොරගහවත්තෙන්ද සහ ජී. එස්. රාජකරුණා හිමිකම් කියන කෝන්ගහලන්දෙන් ද, මායිම් වූ එකී අංක 2342 දරන පිඹුර ප්‍රකාරව අක්කර තිස්තුනයි පර්චස් තිස්හය (අ. 33, රූ. 0 පර්. 36)ක විශාලත්වයෙන් යුක්ත ඉඩම වේ.

මණ්ඩලයේ අණපරිදි

කේ.ඒ.එල්.ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06 - 191/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - යක්කල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2016 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මෙහි පහත පළවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති නිශ්චල දේපළ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී.එන්.ඒකනායක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2014 අගෝස්තු මස

12 වැනි දින සහතික කළ අංක 11121 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුල් ඇන්ඩ් කුල් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2016 පෙබරවාරි මස 14 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත රුපියල් දෙකෝටි පන් ලක්ෂ හතලිස් එක් දහස් පන්සිය අසූනමයයි ශත තිස් හය (රු. 2,05,41,589.36) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද,

මෙහි පහත දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති චංචල යන්ත්‍රෝපකරණ සහ බඩුබාහිරාදිය දේපළ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී.එන්.ඒකනායක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2014 අගෝස්තු මස 12 වැනි දින සහතික කරන ලද අංක 11121 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුල් ඇන්ඩ් කුල් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2016 පෙබරවාරි මස 14 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.වෙත රුපියල් තුන්කෝටි අනූඑක් ලක්ෂ හයදහස් අටසිය අටයි ශත දාහත (රු. 3,91,06,808.17) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද,

එකී හිඟ මුදල්වල එකතු වන රුපියල් පන්සිය අනූහය ලක්ෂ හතලිස් අටදහස් තුන්සිය අනූ හතයි ශත පනස් තුනක (රු. 5,96,48,397.53) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016 පෙබරවාරි මස 15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 11121 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද,

මෙහි පළවන උපලේඛණයේ සවිස්තරව විස්තර කොට ඇති නිශ්චල දේපළ හා පරිශ්‍රය සහ දෙවන උපලේඛණවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ චංචල යන්ත්‍රෝපකරණ බඩුබාහිරදිය සහ දේපළ කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ සියනෑ කෝරලේ මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුල උඩුතුත්තිරිපිටිය හි පිහිටි මීල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු යු. ආර්. එදිරිසිංහ විසින් 2006 නොවැම්බර් මස 22 වැනි දින සාදන ලද අංක 2172/ඒ දරණ පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : පාර, අංක 1507 දරන පිඹුරේ ලොට් 5 සහ එම්. ගුණරත්න ලාල්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : එම් ගුණරත්න, එස්. ඒ. යසරත්න, එස්. ඒ. පීටර් සිංඥෝ හිමිකම් කියන ඉඩම් වලින් ද, දකුණට : එම්. ගුණරත්න මායාදුන්නගේ ඉඩම් වලින් ද සහ බස්නාහිරට : අංක 1507 දරන පිඹුරේ ලොට් 5 සහ 6 න් සහ එම්.ගුණරත්නගේ ඉඩමෙන්ද මායිම් වූ එකී අංක 2172/ඒ දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් එකයි පර්චස් බිංදුවයි හයයි දශම නමයයි හත (අ. 1, රූ. 1, පර්. 06.97)ක විශාලත්වයෙන් වූ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග වන මෙය අත්තනගල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඊ 1037/56 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

පහතින් සඳහන් චංචල යන්ත්‍රෝපකරණ සහ බඩුබාහිරාදිවන අයිතිමය

| අයිතිමය | විස්තරය | මාදිළිය | අනුක්‍රමික අංක |
|---|---|---|---|
| 1 | ප්ලාස්ටික් බොට්ල් කැප් මොල්ඩින් මැෂින් පී.පී. | එස්වයි30බීවයි | අ/නොවේ |
| 2 | ප්ලාස්ටික් බොට්ල් කැප් මොල්ඩින් මැෂින් එච්ඩීපීර් | එස්වයි30බීවයි | අ/නොවේ |
| 3 | ප්ලාස්ටික් බොට්ල් කැප් ලයිනර් මැෂින් | එස්ඩී-280ඒ | අ/නොවේ |
| 4 | ප්‍රින්ටින් මැෂින් | එස්එෆ්-58සීජ් | 803185 |
| 5 | ප්ලාස්ටික් කැප් කටර් | එච්ජී-28 | අ/නොවේ |
| 6 | ප්ලාස්ටික් කැප් කටර් | එච්ජී-28 | අ/නොවේ |
| 7 | ප්ලාස්ටික් කැප් කටර් | එච්ජී-28 | අ/නොවේ |
| 8 | ප්ලාස්ටික් කැප් කටර් | එච්ජී-28 | අ/නොවේ |
| 9 | ස්ක්‍රෑ ඒයාර් කම්ප්‍රේසර (හයි ප්‍රේෂර්) | එස්කේ75 | 11100003 |
| 10 | ස්ක්‍රෑ ඒයාර් කම්ප්‍රේසර (ලෝ පේෂර්) | 9 - 12 | 9030072 |
| 11 | ඒයාර් කම්ප්‍රේසර (බූස්ටර්) | 42ඩබ් | 421103005 |
| 12 | ඒයාර් කම්ප්‍රේසර (බූස්ටර්) | 42ඩබ් | 421103001 |
| 13 | ඒයාර් කම්ප්‍රේසර (හයි පේෂර්) | එච්ටිඒ100 එක්ස් | 250179 |
| 14 | ඒයාර් කම්ප්‍රේසර | එච්65 | 3754 |
| 15 | පෙට් බ්ලෝ මැෂින් | ඊබී2-11 | 2007057 |
| 16 | පෙට් බ්ලෝ මැෂින් | ඊබී2-11 | 2006033 |
| 17 | පෙට් බ්ලෝ මැෂින් | ඊබී2-11 | 2011001 |
| 18 | පෙට් බ්ලෝ මැෂින් | ඊබී2-11 | 2011006 |
| 19 | පෙට් බ්ලෝ මැෂින් | සී5-11බී | 030616 |
| 20 | ඉන්ජෙක්ෂන් මෝල්ඩින් මැෂින් | එච්එස්ජේ220 | 11051103 |
| 21 | ප්ලාස්ටික් ක්‍රෂර් | එස්ජී1635එච් | 3 ජීඑල්11010008 |
| 22 | ප්ලාස්ටික් ක්‍රෂර් | ඩීඑන්360 | 6774 |
| 23 | කූලින් ටවර් | - | අ/නොවේ |
| 24 | කූලින් ටවර් | - | අ/නොවේ |
| 25 | ඩිහියුමිඩිටිෆයර් | එස්එච්ඩී-200 කිග්‍රෑම් | 201206300 |
| 26 | රෙෆ්රිජරේෂන් එයාර් ඩ්‍රයර් | එන්ටිජීඑම් 11/10එච් | 11031351 |
| 27 | රෙෆ්රිජරේෂන් එයාර් ඩ්‍රයර් | එන්ටිජීඑම් 11/40එච් | 11031352 |

බස්නාහිර පළාතේ (නමුත් අත්තනගල්ල ලියාපදිංචි කොට්ඨාසයේ තුළ), ගම්පහ දිස්ත්‍රික්කයේ, වරපලාන උඩුතුත්තිරිපිටිය ඕපාතඇල්ල පාරේ, ප්‍රින්සස් වත්ත වරපලාන වත්තේ හි පිහිටි සීමාසහිත කුල් ඇන්ඩ් කුල් ඒෂියා පුද්ගලික සමාගම පරිශ්‍රයේ ඇති (මෙහි මින් මතු පොදුවේ බන්ධනදායින් චංචල යන්ත්‍රෝපකරණ බඩුබාහිරාදිය ලෙස සඳහන් කරනු ලබන) එනම් උපකරණ උපාංග සහ සියලුම වර්ගවල උපකරණ (විස්තර කුමක්වුවද) සහ වෙනත් අනෙකුත් කොටස් හෝ එහි ඇතුළත හෝ මත්තේහි ඇති එහා මෙහා ගෙනයා හැකි සහ බඩුභාණ්ඩ සහ කලින් කලට බලපැවැත්මට යටත්ව සහ සෑම කලටම යටත් වූ මෙම ගිණුමේ බලපැවැත්වෙන කාලය තුළදී ගෙන යන හෝ තිබිය යුතු හා සියල්ල හෝ වෙනත් ස්ථානයක හෝ ස්ථානවල මෙම අය විසින් මෙම ගිවිසුම පවත්නාතාක් කල් කලින් කලට වේලාවෙන් වේලාවට සියලුම අවස්ථාවල ද මින්මතු ගෙන යුතු හෝ වෙනත් ස්ථානයක හෝ ස්ථානවලට ඔහුගේ ගෙන යා හැකි බන්ධනදායින් මැෂින් සහ උපකරණ කුමන අවස්ථාවක කාලයක කාලයෙන් කාලයට මින්මතු ගෙන යා හැකි යන ආදිය වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ.ඒ.එල්.ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06 - 191/3

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පේරාදෙණිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2016 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. බී. විජේරත්න විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූ ද 2013 ජනවාරි මස 28 වැනි දින සහතික කළ අංක 3230 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙන්කඩසලාම් ශාන්තරාම් සහ ෆාතීමා අසිසා නොහොත් ෆාතිමා අසිසා මීරා සයිබු ශහිඩ් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි හැටහය ලක්ෂ හැත්තෑතුන් දහස් පන්සිය හැට නමයයි ශත හැත්තෑ දෙක (රු.1,66,73,569.72) ක මුදලක් 2016 පෙබරවාරි මස 29 වැනි දින විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී (රු 1,66,73,569.72) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016 මාර්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3230 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරලේ, කඩවත් සතරේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර ග්‍රාමසේවා නිළධාරී වසමේ මහනුවර මහනගර සභා සීමාව තුල ඩී. එස්. සේනානායක වීදියේ හි පිහිටි ඩී. එස්. සේනානායක වීදියේ කලින් වරිපනම් අංක 275, සහ දැන් වරිපනම් අංක 241 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ජේ. අමරසේන විසින් පිළියෙල කරන ලද 2006 ජනවාරි මස 30 වැනි දින සාදන ලද අංක 737 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : වරිපනම් අංක 243 දරන ස්ථිර ගොඩනැගිල්ලෙන් ද, ගිනිකොණට : පදිකවේදිකාව සඳහා වෙන් කරන ලද ඩී. එස්. සේනානායක වීදියෙන් ද, දකුණට : වරිපනම් අංක 239 දරන ස්ථිර ගොඩනැගිල්ලෙන් ද සහ බස්නාහිරට : වරිපනම් අංක 245 දරන එම ඉඩමේම ඉතිරි කොටසෙන් ද මායිම් වූ පර්චස් අටයි දශම තුනයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 8.30) ක විශාලත්වයෙන් ද යුක්ත වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ.ඒ.එල්.ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06 - 191/4

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **ජුනි** | 2016.06.03 | සිකුරාදා | 2016.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.10 | සිකුරාදා | 2016.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.17 | සිකුරාදා | 2016.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.24 | සිකුරාදා | 2016.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2016.07.01 | සිකුරාදා | 2016.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.08 | සිකුරාදා | 2016.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.15 | සිකුරාදා | 2016.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.22 | සිකුරාදා | 2016.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.29 | සිකුරාදා | 2016.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2016.08.05 | සිකුරාදා | 2016.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.12 | සිකුරාදා | 2016.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.19 | සිකුරාදා | 2016.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.26 | සිකුරාදා | 2016.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.